සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 87 S I

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**
* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා එකිනෙකා අතර අදහස් හුවමාරු කරගත්තේ,
i) මුඛයෙන් නිකුත් වන හඬ, ශරීරාංග චලනය, ඉරියව් හා ඉඟි මගින්
ii) බෙර හඬ, ගින්දර, කොළ අතු, වැනි සන්නිවේදන අමු ද්‍රව්‍ය මගින්
iii) ගුහා චිත්‍ර, රූප අක්ෂර හා සංකේත මගින්
iv) ගල් පතුරු, මැටි පතුරු, පැපිරස් පත්‍ර වල අක්ෂර ලිවීමෙන්

(02) සවස ගෙදර එන පියා දුටු තරුෂි අත වනමින්, කෑගසන හඬ ඇසුන මව ඉදිරියට ආවාය. මෙම සිදුවීම හා සම්බන්ධ සන්නිවේදන ස්වරූප අයත් පිළිතුරු කාණ්ඩය වන්නේ,
i) දෘශ්‍ය - අවාචික - වාචික - ශ්‍රව්‍ය - සන්නිවේදන
ii) දෘශ්‍ය - අවාචික - විධිමත් - අවිධිමත් - සන්නිවේදන
iii) දෘශ්‍ය - වාචික - ශ්‍රව්‍ය - අවාචික - සන්නිවේදනය
iv) දශ්‍ය - වාචික - අවිධිමත් - අවාචික - සන්නිවේදන

(03) තම ව්‍යාපාරයට එන පාරිභෝගිකයන්ට ප්‍රිය මනාප බවක් ඇති කිරීමට භාවිත කළ හැකි වඩාත් ගැලපෙන අවාචික සන්නිවේදන අංගය වන්නේ,
i) ව්‍යාපාරය තුළ ආරක්ෂිත විධි විධාන වැඩි කිරීම.
ii) ගොඩනැගිල්ලේ ලාවර්ණ තීන්ත ආලේපනය.
iii) ව්‍යාපාරික ස්ථානයේ පාරිසරික සාධක සිත්ගන්නා ලෙස සැකසීම.
iv) ගණුදෙනුකරුවන් සමඟ සුහදව කථා කිරීම.

(04) ප්‍රදීපාගාර උපක්‍රමයේ දී සිදුවන ක්‍රියාදාමය වන්නේ,
i) කථිකයා හා සවන්දෙන්නා අතර ඇස් සබඳතාව ඇති වීම.
ii) කථිකයා හා සමූහයේ ඉදිරිපෙළ අතර ඇස් සබඳතාව ඇති වීම.
iii) කථිකයා හා මාධ්‍ය උපකරණ අතර සමීප සබඳතාව ගොඩනැගීම.
iv) කථිකයා විවිධ ශිල්ප භාවිත කරමින් දේශන පැවැත්වීම.

(05) ජනප්‍රිය රූපවාහිනී වැඩසටහනකට සහභාගි වූ සිනමා නිළියන් ඇඳ සිටියේ අලංකාර දේශීය අත්කම් සාරියකි. නිවේදිකාව එම සාරිය පිළිබඳ ඇගයීමක් කළාය. මේ තුළින් ජනමාධ්‍යයේ කාර්යභාරය හා වගකීම වී ඇත්තේ,
i) පුද්ගලයා වැඩලෝකයකට හුරු කිරීම.
ii) පුද්ගලයා තුළ දේශීය වෙළෙඳපළ පිළිබඳ සිතුවිල ඇති කිරීම.
iii) ජනතාව තුළ ධනාත්මක චින්තනය ඇති කිරීම.
iv) ජනවාර්ගික සහ සහජීවනය පිළිබිඹු කිරීම.

(06) දෘෂ්ටියේ අඛණ්ඩතාව පිළිබඳ නිවැරදි අර්ථකථනය කුමක් ද?
i) සෙමෙන් චලනය වන වස්තුවක පිහිටීම් අතර පරතරය දැකිය නොහැකි ලෙස මිනිස් ඇස සැකසීම.
ii) දැල්වූ විදුලි පන්දමක දීප්තිමත් ආලෝකය දැකිය හැකි පරිදි මිනිස් ඇස සැකසීම.
iii) ආලෝකය ඉදිරියේ දෑත් හා වෙනත් උපකරණ තබා එහි සෙවනැලි දැකිය හැකි පරිදි මිනිස් ඇස සැකසීම.
iv) වේගයෙන් චලනය වන වස්තුවක පිහිටීම අතර පරතරය දැකිය නොහැකි ආකාරයට මිනිස් ඇස සැකසීම.

(07) ප්‍රධාන තැපැල් කාර්යාලයක සේවය කරන තාරුණි විදේශීය තැපැල් පාර්සල් පරීක්ෂා කිරීම සඳහා යොදා ගන්නා මාධ්‍ය උපකරණය වන්නේ,
i) පියවූ පරිපථ (C.C.T.V), රූපවාහිනී කැමරාව
ii) විනිවිදක යන්ත්‍රය
iii) කදා, ප්‍රක්ෂේපන යන්ත්‍රය
iv) විද්‍යුත් පිරික්සුම් උපකරණය

(08) පුළුල් පරාසයක ඇති වස්තු ඡායාරූපයකට හසුකර ගැනීමට ඔබට අවශ්‍ය නම් ඒ සඳහා භාවිතා කළ යුතු කාච වර්ගය මොනවා ද?

i) සාමාන්‍ය කාච ii) පුළුල් කෝණ කාච iii) දුර රූප කාච iv) සුහුඹු කාච

(09) යම් ආයතනයකට ඇතුල් වන ඔබ ආදාළ අංශය වෙත යෑමට එම ආයතනයේ දක්වා ඇති සංඥා හා සංකේත භාවිතා කරයි. මෙයින් ඉස්මතු වන්නේ,

i) අවාචික හා අවිධිමත් සන්නිවේදන ii) අවාචික හා දෘශ්‍ය සන්නිවේදන

iii) දෘශ්‍ය හා අවාචික සන්නිවේදන iv) දෘශ්‍ය හා අවිධිමත් සන්නිවේදන

(10) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ විශේෂත්වයක් නොවන්නේ කුමක් ද?

i) සන්නිවේදකයා හා ග්‍රාහකයා සම්මුඛ වීම. ii) සිතුවිලි හා හැඟීම් මත සන්නිවේදනය සිදු වීම.

iii) ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය ලැබීම. iv) තම දැක්මට අනුව සංකල්පය ක්‍රියාත්මක වීම.

(11) තම ග්‍රාහකයාට උසස් විනෝදාස්වාදයක් ලබා දීම ජනමාධ්‍ය යුතුකමකි. මේ සඳහා භාවිතා කළ හැකි සෞන්දර්යාත්මක නියොජන අධ්‍යනයේ අංගයක් වන්නේ,

i) නිර්මාණාත්මක චින්තනය ii) රසඥතාව

iii) සෞන්දර්ය හා සමාජ විඥානය iv) විනෝදාත්මක කාර්යය

(12) 17 වන සියවසේ දී සෙවනැලි නාට්‍ය තවදුරටත් වර්ධනය වීමට හේතු වූයේ,

i) මැජික් ලන්තෑරුමය ii) සෙවනැලි වේදිකාය iii) ආලෝක කාචය iv) දීප්තිමත් ආලෝකධාරාය

(13) කාර්යාලීය මාධ්‍ය උපකරණයක් නොවන්නේ කුමක් ද?

i) දින මුද්‍රා යන්ත්‍රය ii) නිල මුද්‍රා යන්ත්‍රය iii) ගණක යන්ත්‍රය iv) ෆැක්ස් යන්ත්‍රය

(14) වෙබ් අඩවියක් පවත්වාගෙන යෑමේ වාසියක් නොවන්නේ කුමක් ද?

i) කාර්යාල තොරතුරු යාවත්කාලීන කිරීම. ii) කාර්යාල කාර්ය සමාජයට විවෘත කිරීම.

iii) යම් ස්ථානයකින් ගෙන යන භාණ්ඩ පරීක්ෂා කිරීම. iv) කාර්යාල කටයුතු විධිමත් හා පිළිවෙළක් විම.

(15) ප්‍රක්ෂේපනය කළ නොහැකි පන්ති කාමර මාධ්‍ය උපකරණයක් නම්,

i) අන්තර් ක්‍රියාකාරී පුවරුව ii) ප්‍රතිශිර්ෂ ප්‍රක්ෂේපන යන්ත්‍රය

iii) කාන්දම් ලෑල්ල iv) ක්ෂණික ප්‍රක්ෂේපන යන්ත්‍රය

(16) වාචික සන්නිවේදනයේ නිපුණතාවයක් සඳහා අදාළ නොවන ප්‍රකාශය වන්නේ,

i) වාග් මාලාව පුළුල් කර ගැනීම. ii) සවන් දීමේ කුසලතාව වර්ධනය.

iii) පෙර සූදානම් වීම. iv) තම අදහස් මත ම යෑපීම.

(17) පහත ප්‍රකාශ හොඳින් අධ්‍යනය කර නිවැරදි පිළිතුර තෝරන්න.

A - ඡායාරූප වෘත්තීය ශික්ෂණයට නිර්මාණශීලීත්වය අදාළ නැත.

B - කෙනෙකුගේ කටයුතු වලට බාධා වුවත් අවශ්‍ය ඡායා රූපය ගැනීමට ඡායාරූප ශිල්පියා දක්ෂ විය යුතුය.

C - ඉගෙනීමට කැමැත්ත දැක්වීම ඡායාරූප වෘත්තිකයෙකුගේ ලක්ෂණයකි.

**ඉහත ප්‍රකාශ අතුරින්**

i) A,B නිවැරදි, C වැරදි ii) A,C නිවැරදි, B වැරදි iii) C,B වැරදි, A නිවැරදි iv) A,B වැරදි, C නිවැරදි

(18) පටල පටකයක ආලෝක සන්වේදීතාව යනු,

i) පටල වේගයයි. ii) පැහැ අන්තරයයි. iii) රූප සංරචනයයි. iv) ස්වර්ණමය රීතියයි.

(19) පහත ප්‍රකාශ අතුරින් පුද්ගලයෙකු තුළ යහපත් සමාජ ප්‍රතිරූපයක් ඇතිවන ප්‍රකාශය තෝරන්න.

i) මුස්ලිම් පරිසක් කළ වැරැද්දකට ඔවුන්ට පහර දීම.

ii) පෞද්ගලික අංශයේ රැකියා තෝරාගන්නා ලද තරුණ පිරිස දැනුවත් කිරීම.

iii) විනෝදාත්මක වැඩසටහන් සමාජ ජාල මගින් නිතර ප්‍රචාරණය.

iv) කුඩා දරුවන්ගේ කුසලතා වර්ධනයට වැඩිහිටි චරිත අනුකරණය කරන ප්‍රාසාංගික වැඩසටහන් ප්‍රචාරය.

(20) හැරල්ඩ් ලැස්වේල්ගේ ආකෘතිය තුළ අඩංගු නොවන ලක්ෂණයක් වන්නේ,

i) සන්නිවේදනය හා බාධාව ii) පණිවිඩය හා ග්‍රාහකයා

iii) ප්‍රතිපෝෂණය හා බාධාව iv) සන්නිවේදනය හා ප්‍රතිපෝෂණය

(21) පාඩම උගන්වන විට එක් දූරියක් කල්පනා කරනු ගුරුවරිය දුටුවාය. ඇය එම ශිෂ්‍යාවට සෙමෙන් කතාකර ගැටළුව විමසුවාය. ඉහත ඉරි ඇඳි කොටස් වලින් දක්වෙන සන්නිවේදන අනුපිළිවෙල වන්නේ,

i) පුද්ගලාන්තර, අන්තර්වර්ති හා සමූහ සන්නිවේදන
ii) අන්තර්වර්ති, පුද්ගලාන්තර හා සමූහ සන්නිවේදන
iii) සමූහ සන්නිවේදන, අන්තර්වර්ති, පුද්ගලාන්තර සන්නිවේදනය
iv) සමූහ සන්නිවේදන, පුද්ගලාන්තර හා අන්තර්වර්ති සන්නිවේදනය

(22) අන්තර් ජාලය නිසා සියලු මාධ්‍ය එකට එක් වීම සිදුවිය. මෙම සංකල්පය,

i) සංජානනයයි ii) අභිසාරිතාවයි iii) ජන සන්නිවේදනයයි iv) මාධ්‍ය ඒකාබද්ධතාවයයි

(23) ඡායාරූපයක පැහැ අන්තරය වැඩි වීම හඳුන්වන්නේ,

i) ආලෝකය ii) අඳුර iii) උණුසුම iv) සිසිල

(24) කතෘගේ පෞද්ගලික හිමිකාරීත්වයට පමණක් අයත් වන පුවත්පත් මොනවා ද?

i) ලංකා ලෝකය/ වීර කේසරී/ දිනමිණ ii) උදය හරාකෙ/ ලංකාදීප/ වීරකේසරී
iii) කවට කථිකයා/ උදය හරාකෙ/ දිනමිණ iv) කවට කථිකයා/ ලංකා ලෝකය/ ලංකාදීප

(25) පුවත්පතක ප්‍රධාන මාධ්‍යවේදී තනතුර දරන්නේ රවීශ ය. ඔහුගේ වෘත්තීය තත්වය,

i) නියෝජ්‍ය කතෘ ii) ප්‍රධාන විධායක iii) ප්‍රධාන කතෘ iv) සභාපති

(26) A - ව්‍යාපාරික අනුග්‍රාහක් නැතිව ජනමාධ්‍යකට පැවතිය නොහැකිය.
B - ග්‍රාහකයා වෙත ළඟා වන්නේ මාධ්‍යවේදීන්ය.
C - ජන සමාජයේ සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීම මාධ්‍ය සතු වගකීමකි.

ඉහත වගන්ති අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i) A හා C නිවැරදි, B වැරදි ය ii) C හා B නිවැරදි, A වැරදි ය
iii) A, B, C ප්‍රකාශ තුනම වැරදි ය iv) A, B, C ප්‍රකාශ තුනම නිවැරදි ය

(27) යම් නිත්‍යානුකූල දේශ සීමවක් තුළ නීත්‍යානුකූලව ජීවත් වන්නා හඳුන්වන්නේ,

i) ඡන්ද දායකයා ii) පුරවැසියා iii) දේශපාලකයා iv) ග්‍රාහකයා

(28) ඡායාරූපකරණයේ දී වර්ග අඟලක් තුළ ඇති පික්සල් සංඛ්‍යාව හඳුන්වන්නේ,

i) ගහණතාව ii) ධාරිතාව iii) විනිවිදක iv) ගොනු ආකෘති යනුවෙනි

(29) මාධ්‍ය සාක්ෂරතාව යනුවෙන් හැඳින්වෙන්නේ, පුරවැසියෙකු තුළ ඇති

i) අකුරු කියවීමට හා ලියවීමට ඇති හැකියාව. ii) මාධ්‍ය පරිහරණයට ගත කරන කාලය.
iii) මාධ්‍ය නිසිලෙස හැසිරවීමේ හැකියාව. iv) මාධ්‍ය පිළිබඳ ඇති ආකල්ප.

(30) පහත ජන සන්නිවේදනය පිළිබඳ ඇති වගන්ති තුළින් වැරදි ප්‍රකාශය තෝරන්න.

i) සන්නිවේදකයා නොදන්නා අති විශාල ජනතාවක් ජන සන්නිවේදනය තුළ ඇත.
ii) ආදී කාලීන ජනයා කිසිසේත් අපේක්ෂා කරන ලද්දක් නොවේ.
iii) ජන සන්නිවේදනය සිදුවන්නේ ජන මාධ්‍ය මගිනි.
iv) සමූහය කුඩා හෝ විශාල විය හැකිය.

(31)

| | | | | |
|---|---|---|---|---|
| සන්නිවේදකයා | සන්දේශය | A | B | බලපෑම |

ඉහත ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය දක්වා ඇත. එහි A හා B ස්ථාන වලට අදාළ නිවරදි ප්‍රකාශය වන්නේ,

i) A - ග්‍රාහකයා B - මාධ්‍යය ii) A - මාධ්‍ය B - ග්‍රාහකයා
iii) A - සන්නිවේදනය B - මාධ්‍යය iv) A - ග්‍රාහකයා B - පණිවිඩය

(32) අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී යොදා ගැනෙන සන්නිවේදන මෙවලම් අතරට අයත් නොවන කාණ්ඩය තෝරන්න.

i) තැපැල් ලිපි, ෆැක්ස් පණිවුඩ ii) විද්‍යුත් තැපෑල, අන්තර්ජාල දුරකථන
iii) සමාජ ජාල, ශබ්ද විකාශන යන්ත්‍ර iv) සමාජ ජාල, දුරකථන

(33) සන්නිවේදන ස්වරූපයකට අයත් නොවන්නේ,

i) සමූහ සන්නිවේදන ii) ලිඛිත සන්නිවේදනය iii) ශ්‍රව්‍ය සන්නිවේදන iv) දෘශ්‍ය සන්නිවේදනය

(34) පහත දක්වෙන ආකෘති අතුරින් විධිමත් සන්නිවේදන ආකෘතියක් නොවන්නේ,
i) චක්‍රීය ආකෘතිය ii) තනි දම ආකෘතිය iii) දම ආකෘතිය iv) රෝද ආකෘතිය

(35) පරිගනක ආශ්‍රිත ක්‍රියාවලියේ ප්‍රධාන පියවර පහත දක්වා ඇත.

අත් පිටපත සැකසීම

අකුරු යෝජනය හා පිටු සැලසුම

අ

ආ

ඉහත අ සහ ආ සඳහා අදාළ නිවැරදි ප්‍රකාශ වන්නේ කුමක් ද?
i) අ - මුද්‍රණය හා පිටපත්කරණය
ආ - සෝදුපත් කියවීම
ii) අ - මුද්‍රණය
ආ - පිටපත්කරණය
iii) අ - නිමි කටයුතු
ආ - බෙදා හැරීම
iv) අ - මුද්‍රණය හා පිටපත්කරණය
ආ - නිමි කටයුතු

(36) අ - ස්ථාවර දුරකථන මෙන් ස්ථාන දෙකක ක්‍රියාත්මක වේ.
ආ - එක් ස්ථානයකින් ඇතුළත් කරන කඩදාසියක ඇති සටහන විද්‍යුත් තරංග බවට පත් කරයි.

ඉහත දක්වා ඇත්තේ තොරතුරු හුවමාරු කරන මාධ්‍ය උපකරණයක ලක්ෂණයකි. එම උපකරණය කුමක් ද?
i) විද්‍යුත් කැඳවනය ii) විද්‍යුත් තැපෑල iii) අන්තර්ජාලය iv) ෆැක්ස් යන්ත්‍රය

(37) ආගමික හා සදාචාරාත්මක නියෝජන අධ්‍යනයට ඇතුළත්වන ක්ෂේත්‍රයක් තෝරන්න.
i) විනෝදාත්මක කාර්ය, ආගම, නිර්මාණාත්මක චින්තනය
ii) සමාජ විඥාණය, සංවර්ධනාත්මක චින්තනය, ගැටුම් හා සාමය
iii) සදාචාරය හා සාරධර්ම, මානව ධර්මතා, ගැටුම් හා සාමය
iv) මානව හිමිකම් හා වගකීම්, වාර්ගිකත්වය, මානව ධර්මතා

(38) අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීම සඳහා භාවිතා නොවන මෘදුකාංග වන්නේ,
i) ඇඩෝප් පේජ් මේකර් ii) ගූගල් iii) කොරල් ඩ්‍රෝ iv) මයික්‍රෝ සොෆ්ට් වර්ඩ්

(39) අ - බැටරි අවශය නැත. ආ - සේයා පටල අවශය නැත.

ඉහත කැමරා වර්ගය වන්නේ,
i) ඩිජිටල් කැමරාවයි ii) සේයා පටල කැමරාවයි
iii) ජංගම දුරකථන කැමරාවයි iv) ඒක කාච කැමරාවයි

(40) ගුහා චිත්‍ර සන්නිවේදන කාර්යයේ දී ඉතා වැදගත් අංගයකි. අවුරුදු 18500කට පමණ පෙර කරන ලදැයි සැලකෙන ගුහා චිත්‍ර වන්නේ,
i) අල්ටාමීරා හා ලැස්කෝ ගුහා චිත්‍ර ii) අල්ටාමීරා හා සීගිරි චිත්‍ර
iii) ලැස්කෝ ගුහා චිත්‍ර හා අජන්තා චිත්‍ර iv) අජන්තා චිත්‍ර හා සීගිරි චිත්‍ර

* * * * *

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 87 S II |
|---|---|---|

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II** කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**
* පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
* තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

(01) පසුගිය කාලයේ මහනුවර ප්‍රදේශයේ සිදු වූ ගැටුම්කාරී තත්වය මත ඇඳිරි නීතිය පැනවීම, පාසල් නිවාඩු දීම හදිස්සියේ සිදුවිය. මෙහි දී ජනමාධ්‍ය වලට විවිධ චෝදනා මෙන්ම වගකීම්වලටද මුහුණ දීමට සිදුවිය.

i) ඇඳිරි නීතිය පැනවීම සහ පාසල් නිවාඩුව පිළිබඳ ජනතාව දැනුවත් කරන ලද සන්නිවේදන වර්ගය කුමක් ද?
ii) ඉහත ගැටුම්කාරී තත්වය පාලනය කිරීමට රජය සමාජ මාධ්‍ය ජාල තාවකාලිකව ක්‍රියාවිරහිත කරන ලදී. නව සමාජ මාධ්‍ය දෙකක් ලියන්න.
iii) ඉහත තොරතුරු ජනතාව වෙත ලබා දීම සඳහා රූපවාහිනිය මගින් යොදාගත හැකි වැඩසටහන් අංශ දෙකක් දක්වන්න.
iv) මෙම ගැටුම්කාරී අවස්ථාව විකෘතිව සන්නිවේදන වූයේ ග්‍රාහක සංජානනයට බාධා වූ නිසාය. සංජානනයට බාධා වන හේතු දෙකක් ලියන්න.
v) මෙම සිදුවීම විධිමත් සන්නිවේද ස්භාවය ඉස්මතු කරන අවස්ථාවකි විධිමත් සන්නිවේදන ආකෘති නම් කරන්න.
vi) මෙවැනි අවස්ථාවක් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ දී ජනමාධ්‍යකරුවන් පිළිපැදිය යුතු ආචාර ධර්ම දෙකක් ලියන්න.
vii) රටක සිටින මාධ්‍යවේදීන් දෙකොටසකි. ඔවුන් නම් කරන්න.
viii) ජනමාධ්‍ය වාණිජ අරමුණු ඉටු කරගනිමින් කටයුතු කරයි. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තම වාණිජ අරමුණු ඉටු කරගන්නා ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.
ix) ඉහත සිදුවීම සම්බන්ධව මහනුවර ප්‍රදේශයේ දියණියක් අගනුවර සිටින පියාට දුරකථනය මගින් තොරතුරු පවසයි. නමුත් පියා පවසන්නේ ඇය පවසන දේ පැහැදිලි මදි බවය. සන්නිවේදන බාධක වර්ග දෙක විස්තර කරන්න.
x) ද්වි මාර්ගික සන්නිවේදන සූත්‍රය ඇඳ දක්වන්න. (ලකුණු 10 x 2= 20)

(02) හැඟීම්, සිතිවිලි හා අදහස් අන් අය සමඟ හසුරුවා ගැනීම සන්නිවේදනයයි.
i) සන්නිවේදනය පිළිබඳ ලැස්වෙල්ගේ අර්ථකථනය දක්වන්න.
ii) සන්නිවේදනයේ මූලික කාර්යයන් හතරක් ලියන්න.
iii) සමූහ සන්නිවේදනයේ විශේෂතා තුනක් ලියන්න.
iv) සන්නිවේදනයේ ඓතිහාසික වර්ධනය තුළ සිදු වූ වැදගත් සිද්ධීන් අටක් දක්වන්න.

(03) ඡායා රූප කඳවුරක් මහනුවර ප්‍රධාන පාසලක පැවැත්විණි. ශිෂ්‍ය ශිෂ්‍යායාවන් විශාල පිරිසක් එයට සහභාගී වූහ.
i) ඡායාරූප ගැනීමට ඔවුන් රැගෙනවිත් තිබූ කැමරා වර්ග දෙක නම් කරන්න.
ii) ඡයාරූප පුවත්පත් කලාවට අයත් අංග දෙකක් නම් කරන්න.
iii) ඡායාරූප ගැනීමේ දී පසුකළ පියවර මොනවාද?
iv) ඡායාරූප භාවිතය නිසා මුද්‍රිත මාධ්‍යට ලැබෙන වාසි හතරක් ලියන්න.

(04) වින්දුල ඡායාරූප ශිල්පියෙකි. ඔහු භාවිත කරනුයේ අංකිත කැමරාවකි.
i) අංකිත ඡායාරූපකරණයේ විශේෂතා හතරක් ලියන්න.
ii) කැමරාවක අනිවාර්යෙන් පිහිටන කොටස් ලියන්න.
iii) ප්‍රවෘත්ති ඡායාරූපයක අඩංගුවන ප්‍රවෘත්තිමය ගුණාංග දෙකක් විස්තර කරන්න.
iv) කැමරාවක ඇති කාච වර්ග හතරක් පැහැදිලි කරන්න.

(05) විදුහලට පැමිණි මාධ්‍ය විෂය භාර නව ගුරු මහත්මිය මාධ්‍ය උපකරණ භාවිතයට උනන්දු වීම නිසා ශිෂ්‍ය පිරිස විෂය අධ්‍යනයට ප්‍රියතාවයක් දක්වති.

i) ප්‍රක්ෂේපනය නොවන මාධ්‍ය උපකරණ හතරක් ලියන්න.

ii) ප්‍රක්ෂේපනය වන මාධ්‍ය උපකරණ භාවිතා කිරීමේ වාසි දෙකක් ලියන්න.

iii) මාධ්‍ය උපකරණ භාවිතය නිසා ගුරු භවතා ලබා ගන්නා ප්‍රයෝජන තුනක් විස්තර කරන්න.

iv) ප්‍රක්ෂේපනය වන ඕනෑම මාධ්‍ය උපකරණයක් ගැන කෙටි විස්තරයක් ලියන්න.

(06) සන්නිවේදන ස්වරූප පිළිබඳ දේශනයක් පසුගිය දා පැවැත්විනි. එහි දි සිසුන්ට විවිධ ගැටළු ඇති විය.

i) සන්නිවේදන ස්වරූප යන්න හඳුන්වන්න.

ii) වාචික සන්නිවේදන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කාර්යයන් හතරක් ලියන්න.

iii) සම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍ය සහ නූතන දෘශ්‍ය මාධ්‍ය දෙක බැගින් දක්වන්න.

iv) අවිධිමත් සන්නිවේදනයේ ආකෘති හතර ඇඳ දක්වන්න.

(07) ලෝකය පුරා තොරතුරු හුවමාරුවට යොදා ගන්නා මාධ්‍ය උපකරණ දවසින් දවස සංවර්ධනය වෙමින් පවතී. එමනිසා තොරතුරු හුවමාරු කිරීමේ මාධ්‍ය ප්‍රචලිත වී ඇත. .

i) තොරතුරු හුවමාරුවට යොදා ගන්නා උපකරණ හතරක් නම් කරන්න.

ii) විද්‍යුත් පිරික්සුම් උපකරණය භාවිතයේ වාසි දෙකක් දක්වන්න.

iii) දුරකථන ආචාර ධර්ම තුනක් පැහැදිලි කරන්න.

iv) වෙබ් අඩවි පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

* * * * *

**වර්ෂ අවසාන පරීක්ෂණය - 2018**
**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - 10 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 2 | 21. | 4 | 31. | 2 |
| 02. | 3 | 12. | 1 | 22. | 2 | 32. | 3 |
| 03. | 3 | 13. | 4 | 23. | 1 | 33. | 1 |
| 04. | 1 | 14. | 3 | 24. | 3 | 34. | 2 |
| 05. | 2 | 15. | 3 | 25. | 3 | 35. | 4 |
| 06. | 4 | 16. | 2 | 26. | 4 | 36. | 4 |
| 07. | 4 | 17. | 4 | 27. | 2 | 37. | 3 |
| 08. | 2 | 18. | 1 | 28. | 1 | 38. | 2 |
| 09. | 3 | 19. | 2 | 29. | 3 | 39. | 1 |
| 10. | 1 | 20. | 3 | 30. | 4 | 40. | 1 |

## II කොටස

(01) (i) ජනසන්නිවෙව්දනය
(ii) Face book/ Twitter/ Yahoo/ Google/ Linkedeiu
(iii) ප්‍රවෘත්ති - වැඩ සටහන් අංශ
(iv) සංදේශ තුළ විවිධාර්ථ තිබිම/ වැරදි ලෙස තොරතුරු ගොනු කිරීම/ තොරතුරු විකෘති වීම/ ග්‍රාහක අත්දැකීම් පසුතලයේ නොගැලපිම
(v) චක්‍රිය/ දම/ Y /රෝද
(vi) * ජනතාවගේ යහපත උදෙසා කටයුතු කිරිම * නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරිම
* පක්ෂග්‍රාහි නොවීම * සමතුලිත බව * විශ්වාසනීයත්වය
(vii) ආයතනයකට සම්බන්ධ මාධ්‍ය වේදීන්/ නිදහස් මාධ්‍යවේදීන්
(viii) පුවත්පත් - ඉඩකට අලෙවි කිරිම
ගුවන් විදුලිය හා රූපවාහිනිය - ගුවන් කාලය අලෙවි කිරිම (වෙළෙඳ දැන්වීම් සඳහා)
(ix) අර්ථ බාධක/ මාධ්‍ය බාධක - ඉතා කෙටි හැඳින්වීමක ලකුණු දෙන්න.
(x)




(ලකුණු 10 x 2 = 20)

(02) (i) who/ says what/ In which channel/ To whom/ with what effect (ල:2)
(ii) තොරතුරු සැපයිම/ අධ්‍යාපනය ලබා දිම/ විනෝදාස්වාදය/ සමාජානුයෝජනය/ සංවාද
(පෙළ පොත පිටුව 15) (ල : 2)
(iii) පිටුව 34 පිළිතුර සඳහා බලන්න. (ල : 3)
(iv) කථන භාෂාව සැකසීම/ රූප මගින් අක්ෂර නිර්මාණය/ සංකේතාත්මක අක්ෂර නිර්මාණය/ හෝඩිය නිර්මාණය/ විවිධ දෑ යොදා ගෙන ලිවීම, ඇරඹීම. (ල : 3)
(මුළු ලකුණු 10 )

(03) (i) ඩිජිටල් - අංකිත කැමරාව/ ඒක කාච ප්‍රතිජාය කැමරාව (ල : 1)
(ii) ප්‍රවෘත්ති ඡයාරූප කලාව/ විශේෂාංග ඡායාරූප කලාව/ දැන්වීම් ඡායාරූප කලාව (ල : 3)
(iii) මානනය/ නාභිගත කිරිම/ අනාවරණය (ල : 3)
(iv)

(04) (i) පිටුව 149 (ල : 2)
(ii) කැමරා කාචය/ ද්වාරය/ කාච විවරය (ල : 3)
(iii) කාලෝචිත බව/ කැපි පෙනීම/ බලපෑම/ සමීපතාව/ මානව ඇල්ම/ අසාමාන්‍ය බව/ නැවුම් බව/ ගැටුම්කාරී බව/
(iv) සාමාන්‍ය කාච/ දුර රූප/ පුළුල් කෝණ/ යුහුඹු (පිටුව154) (ල : 3)

(05) (i) කළු ලෑල්ල/ සුදු ලෑල්ල/ චුම්බක පුවරුව/ පත්‍රිකා ලෑල්ල/ පිටු පෙරලනය (ල : 2)
(ii) පහසුවෙන් අවබෝධ වීම/ දෘශ්‍ය වීම/ ප්‍රියමනාප බව/ අවධානය සෘජුව යොමු වීම/ කාර්යක්ෂමතාව

(iii)
(iv)

(06) (i) ග්‍රාහකයා තොරතුරු ලබා ගන්නා ආකාරය (ල : 2)
(ii) සිතීම විධිමත් කිරීම/ වාචික ප්‍රකාශන/ සැබෑව හඳුනා ගැනීම/ දැනුම සංරක්ෂණය/ කාලය සන්නිවේදනය

(iii) සාම්ප්‍රදායික - ගින්දර/ දුම/ ගස්වල එල්ලු අතු/ චිත්‍ර/ ගස්වල කැපු කට්ට
නූතන දෘශ්‍ය මාධ්‍ය - අත් පත්‍රිකා/ පෝසටර්/ පොත් පිංච/ බිත්ති සටහන්/ ධාරා සටහන්/ මාර්ග සංඥා
(iv) තනි දමය/ ඕපදූප දමය/ සම්භාවිතා ද්‍රවය/ පරිජේද දමය

(07) (i) දුරකථන/ ෆැක්ස් යන්ත්‍ර/ විද්‍යුත් කැඳවනය/ විද්‍යුත් තැපැල/ වෙබ් අඩවි
(ii) ⋆ යම් ස්ථානයකින් ගමන් කරන පුද්ගලයෙකු සතු දෘශයමාන නොවන තොරතුරු අනාවරණය

⋆ යම් ස්ථානයකින් ගෙන යන භාණ්ඩ වල තොරතුරු අනාවරණය
(iii) පිටුව 77
(iv) අන්තර්ජාල පහසුකම් යොදා ගනිමන් යම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් මගින් පවත්වාගෙන යනු ලබන විද්‍යුත් තොරතුරු ගොනුවකි. මේ සඳහා යම් මුදලක් ගෙවිය යුතුය. (පිටුව 80)